

# පාපකර්ම නොකර ප්‍රතිපත්ති දේශපාලනය කරන්න

## පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමියෝ මහින්ද සහ රනිල්ගෙන් ඉල්ලති

තාවකාලික ආණ්ඩුවක් යටතේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සෑදිය යුතුයි. මුලු පාර්ලිමේන්තුවම ව්‍යවස්ථාදායක සභාවක් කරලා ජනතා අදහස් ලබාගෙන බහුජන සංවිධානවලට අවස්ථාව ලබාදීලා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සෑදිය යුතුයි.

ඒ වගේම 17 වෙනි සංශෝධනය හරියට ක්‍රියාත්මක කරන්න ඕනේ. පරිපාලනය කිළුටු කරන්න එපා. පොලිසිය කිළුටු කරන්න එපා. අල්ලස් දූෂණ වංචාවලට යාලුකම් නෑදෑකම් බලන්න එපා. නීතිය හරියට ක්‍රියාත්මක කරන්න.

පහුගිය කාලේ අපි දැක්කා උදේට පන්දාහයි දන්සැලේ. හැන්දෑවට පන්දාහයි. ඒවායේ කාපුවට තවම කෝටි ගාණක් හිල්ටන් එකට බිල් ගෙවන්න තිබෙනවා. දැන් දන්සැල වහලා. එදා රජයේ වාහන සියල්ල පාවිච්චි කළා. අද එහෙම යොදාගන්න වාහනයකට ලක්ෂයක් රජයට දෙන්න ඕනේ. එදා පොල්ගස් තරම් උස කටවුට් තිබුණා. කටවුට් පරිස්සම් කරන්න පොලිසියත් දාලා හිටියා. අද කටවුට් ඇත්තෙත් නෑ. ඒ නිසා පොලිසියත් ඒ තැන්වල නෑ. බස්වලට ගෙවන්න තියනවා කෝටි තුන්සිය ගාණක්. ගුවන්යානාවලට ගෙවන්න තියනවා. මේවා ගෙවන්නේ කවුද? මේ බර අපේ පිට පටවලා.

මේක හදන්න පුලුවන් රටක්. අපි මාර්තු 12 අස්සන් කළ ගිවිසුමේ තියෙනවා මැතිවරණයට කසිප්පුකාරයෝ දාන්න එපා. සල්ලාලයෝ දාන්න එපා. පාතාලයෝ, කුඩුකාරයෝ, ස්ත්‍රී දූෂකයෝ, දාන්න එපා කියලා. නමුත් දැම්මා. කමක් නෑ දැම්මට. අපේ අතෙයි බලය තියෙන්නේ. අපිට පුලුවන් ඕගොල්ලෝ පාර්ලිමේන්තුවට එන්න එපා කියලා බෙල්ලෙන් අල්ලලා තල්ලුකරලා දාන්න. ඕගොල්ල දන්න නීතියක් නෑ. ඕගොල්ල දන්න පරිපාලනයක් නෑ. ඕගොල්ල ඕගොල්ලන්ගේ රස්සාව කරගෙන ඉන්න. පාර්ලිමේන්තුවට එන්න එපා කියලා කියන්න.

අද මේ ගිවිසුම අස්සන් කළේ ඒ වෙනස කරන්න. ඒ විතරක් නොවෙයි මේ රටේ අල්ලස, දූෂණය, වංචාව මේ රටේ රජ්වෙලා තියෙන්නේ. මේ සියලු සංවිධාන මේ බලය අද පවරන්නේ අල්ලසින් දූෂණයෙන් තොර රටක් හදන්නයි.

අග්‍රාමාත්‍යතුමනි, විශේෂයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා. මේක කාල පුරුදු වුණ අය කවුරුත් රස විඳින්න ආසයි. අපේ අයත් ගහනවා. අපේ අයත් වැඩේ පටන්ගන්නවා. ඒ නිසා ඔබතුමාට අපි ආරාධනා කරනවා ලී ක්වානු යූ සිංගප්පූරුවේ නායකයා ආදර්ශයට ගන්න කියලා. එතුමගේ හිතවතෙක් ගහලා අහුවෙලා එතුමා හම්බවෙන්න ආවා බේරගන්න කියාගෙන. එතකොට ලී ක්වාන් කියනවා ඔබතුමාට මට එක උදව්වක් කරන්න පුලුවන්. එක්කෝ වහ බීලා මැරෙන්න. නැත්නම් ජීවිතාන්තයට හිරේ යන්න කියලා.

ඔබතුමාටත් ඒ වැඩේ කරන්න වෙනවා. ඔබතුමාගේ මිනිසුත් අල්ලස් ගත්තොත් පගා ගත්තොත් දූෂණ කළොත් කොමිස් ගැහුවොත් අඩගහලා කියන්න කරුණාකරලා වහ වීදුරුවක් බීලා මැරෙන්න කියලා. එහෙම නැත්නම් කනෙන් ඇදලා වීසි කරලා දාන්න. තියන්න එපා. හොරුන්ට, අල්ලස්කාරයන්ට, කොමිස්කාරයන්ට ඕනේ විදිහට වැඩකරන්න ඉඩ දෙන්න එපා. ජනතාව වෙනුවෙන් දැඩිව නීතිය ක්‍රියාත්මක කරන්න. දූෂණයෙන් තොර, වංචාවෙන් තොර රාජ්‍යයක් ගොඩනගන්න. හොඳ රාජ්‍ය පරිපාලනයක් රටේ ඇතිකරන්න. හොඳ තානාපති සේවයක් රටේ ඇති කරන්න.

අපි පුරසාරම් කතා කළාට රටේ ජනතාවගෙන් බහුතරය දුප්පත්. සුලුතරය පොහොසත්. ඇති නැති පරතරය විශාලයි. ඒ පරතරය නැති කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙන්න. රටේ ජනතාවගෙන් 75%ක් ගොවිතැනින් ජීවත්වෙන අය. ඒ ජනතාව ඉල්ලන්නේ යළ මහ වපුරගන්න වතුර. ඒ නිසා අනාගතයේදී මුහුද ගොඩකරන්නට නෙවෙයි මේ රටේ වැව් ටික ඇල වේලි ටික හදන්න ප්‍රමුඛස්ථානය දෙන්න.

ඒකත් හරියට අධීක්ෂණය කරලා කරන්න. නැත්නම් කොන්ත්‍රාත්කාරයා වැවේ වතුර ටිකත් බීලා යයි. ඒ තරමටම හැම තැනම හොරකම ඔඩුදුවලා තියෙන්නේ. ඒ වගේම ගොවි නිෂ්පාදනවලට වෙළඳ පොල හදා දෙන්න. වීවලට රුපියල් පනහක් නියම කළා නම් ඒ ගානට ඒක විකුණගන්න අවස්ථාව හදා දෙන්න. ආණ්ඩුවක් අවශ්‍ය මේකට. ළමයින් ඉස්කෝලේ දාන්න නෙවෙයි.

ඒ වගේම අග්‍රාමාත්‍යතුමනි, මේ රටේ කාන්තාවන් ලක්ෂ ගාණක් මැදපෙරදිග වහල් මෙහෙවරට යවලා තිබෙනවා. හොයලා බලන්න ඕමාන්වල, ඩුබායිවල, කටාර්වල, තානාපති කාර්යාලවල යට තට්ටුව එහෙම පිටින්ම අනාථ කඳවුරු. බබාල හම්බවෙන්න ඉන්න අය. හම්බවෙච්ච අය. අඬන අය. ලෙඩ්ඩු. දහස් ගාණක් අනාථ වෙලා. ලංකාව ලෝකයට වහල්ලු සපයන වහල් කඳවුරක් කරන්න එපා. මේ රටේ කර්මාන්ත ශාලා ආරම්භ කරන්න.

වවන්න පුලුවන් දේ වවන්න. මේ තරම් තණකොළ තියන රටේ බොන්න කිරි ටික හදාගන්න අපිට පුලුවන් වුණාද? කිරි ටික හදාගන්නේ කොහෙ-ාමද අපිට වැඩිය හරක් නෑනේ. ඒ නිසා කිරිත් නෑ. බොන්න කිරි ටික, අඳින රෙදි කෑල්ල, බයිසිකල් කටුවක්, අල්පෙනෙත්තක් හදාගන්න බැරිවෙච්ච ජාතියක්. දැන්වත් මේවා ගැන කල්පනා කරන්න. අවුරුදු හැට පහක් ගියා ළමයෙක් ඉස්කෝලේ දාන්න ක්‍රමයක් හදාගන්න බැරිවුණු රටක් මේක. සැළසුමක් ඇතුව ගමනක් යන්න.

මේ සැරේ අපි ඔබතුමාලට බලය දීලා ඔබතුමාල පස්සේ එන්නේ නැහැ. අපි උකුස්සෝ වගේ බලා ඉන්නවා. අපිත් ඔබතුමාලගේ ඇමැති මණ්ඩලය වගේ ඇමැති මණ්ඩලයක් පත්කරගන්නවා. වැඩේ හරියට කරන්න. එහෙම නම් අපි ආශිර්වාද කරනවා. හරියට නොකරනවා නම් අපිට පුරවැසියන් හැටියට අයිතියක් තිබෙනවා අපේ රට හදන්න.

මේ මැතිවරණය හරි තීරණාත්මකයි. ඒ නිසා ජනතාවගෙන් ඉල්ලනවා රටට නීති හදන්න උගත්කම, ශීලාචාරකම, හැදිච්චකම, මනුස්සකම, අවංකකම, ජනතා ගෞරවාදරය දිනූ මිනිස්සුන්ගෙන් පාර්ලිමේන්තුව පුරවන්න කියා අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. අද අපි මේ අස්සන් කළ ගිවිසුම ඔබතුමා ආරක්ෂා කරාවි කියලා අපි බලාපොරොත්තු වෙනවා.



**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

සීනි බෝල කතන්දර වැඩක් නැහැ. කසාද බැන්දම රුපියල් දෙලක්ෂයක් දෙනවා කියා දැන් හිටපු ජනාධිපතිතුමා කියනවා. දැන් තියෙන්නේ බැඳපු අයටත් නිදහස් වෙන්න. අලුතෙන් බැන්දම ලක්ෂ දෙකක් හම්බවෙනවානේ. ළමයින්ට පනස්දාහක් දෙනවා. සමෘද්ධිය වැඩිකරනවා. පරිප්පු රුපියල් පහක් අඩුකරනවා. කරන්න පුලුවන් වැඩද මේ කියන්නේ. ඕව ප්‍රතිපත්තිද? කාටත් කියන්නේ ඔය පුහු කතන්දර කියන එක නවත්තන්න. ප්‍රතිපත්ති දේශපාලනයක් කරන්න.මහත්මා ගාන්ධි කිව්වේ ප්‍රතිපත්තියක් නැති දේශපාලනය මහ පාප කර්මයක් කියලා. ඒ පාප කර්මයට අපි ගොදුරුවෙලා ඉන්නවා. දැන්වත් ප්‍රතිපත්ති ගරුක දේශපාලනයක් කරා යන්නට ඔබ සියලු දෙනාට ආරාධනා කරනවා.



# මුතුහර හරසර

**සිඩ්නි මුතුහර ළමා සමාජයට පස්වසරක් පිරීම නිමිත්තෙන් මෑතකදී දූ දරුවන් ගේ කුසලතා එළිදැක්වීමක් වශයෙන් "හිරුමල හිනැහෙනවා" සංයුක්ත තැටිය නිකුත් වුනා. 2009 සැප් මාසයේදී පළමුවන ජාත්‍යාන්තර සිඩ්නි ශාඛාව වශයෙන් බිහිවුන "මුතුහර" ළමා සමාජය සිඩ්නි නුවර සමාජීය හා සංස්කෘතික ක්‍රියාකාරකම් වලදී සක්‍රීයව දායකවෙනවා.**








**සම්බන්ධීකරණය හා අධීක්ෂණ කටයුතු වලදී පෙරමග ගත් මුතුහර සිඩ්නි සංවිධායක**

**සාමප්‍රිය සුමනසේකර මහතා සඳහන් කරන්නේ මුතුහර පිළිබඳව මෙවැනි අදහසක්.**

"ප්‍රධානම දේ ලංකාවේ ඉන්නා සම වයසේ ළමුන් සමග සම්බන්ධ වී දෙරටේ දරුවන් ගේ හැකියාවන් ක්‍රියාකාරකම් එකතු වී වැඩි දියුණුකර ගැනීම. ඒවගේම මෙරට ඉන්නා අපේ දූ දරුවන් ඒ බැඳීම් එක්කම අපේකම, සිරිත් විරිත්, යහගුණ ග්‍රහණය කරගන්නවා. බොහෝ විට දී ලංකාවේ **ජාතික රූපවාහිනී නාලිකාව** මේ දරුවනටත් ලංකාවේ වෙසෙන දරුවනටත් බොහෝ වරප්‍රසාද ලබාදී තිබෙනවා සංස්කෘතික ක්‍රියාකාරකම් හා හැදියාවන් ගොඩනගා ගන්නට.

**ජාතික රූපවාහිනී නාලිකා** කාර්‍යය මණ්ඩලය බොහෝ විට මේ වැඩ කටයුතු වලට කැපවීමෙන් උදව්කරනවා. ජාතික රූපවාහිනියෙන් බිහි වූ මුතුහර ළමා සමාජය දේශ දේශාන්තරය දක්වා වූ ළමුනගේ හැකියාවන් ක්‍රියාකාරකම් සඳහා දිරිය ජවය දෙන්නා වූ ප්‍රජා සත්කාරයක්".





සංයුක්ත තැටිය වෙනුවෙන් කල කැපකිරීම පිළිබඳව මුතුහර සභාපති කෙල්සි මුරමුදලි ගේ අගැයුම



**ගතවුන පස් වසර මුළුල්ලේ සිටන් අද දක්වාම අනුශාසකත්වය හොබවමින් දූ දරුවනගේ ඉදිරි ගමනට උපදෙස් උපකාර සළසන සිඩ්නි නුවර වෙසෙන නෝට්‍රඩාම් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අධිනීතිඥ මෛත්‍රි පනාගොඩ මහතා ගේ මුවින් නැගුනේ මුතුහර ඉදිරි දැක්ම පිළිබඳව මෙසේයි.**

"සිඩ්නි නුවර වෙසෙනා වූ දූ දරුවනගේ ක්‍රියාකාරකම් වලට උනන්දු වෙන පිරිස් එකතුවෙලා ළමුන් වෙනුවෙන් මුතුහර ගොඩනගන්නට වෙහෙස මහන්සි වුනා. මෙයට පුරෝගාමී වූ **ශ්‍රියාණි අබේනායක** මහත්මිය ඇතුළු දෙමාපියන් මෙන්ම පෙර දායකවූ **අයෝමි බොස්කෝ** මම ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ පටන් ගත් මග ඉදිරියට ගෙන යන්නට මාගේ යම් කිසි උපකාරයක් වේ නම් එය ඉහලින්ම කරන්නට තමා මා උනන්දු වෙන්නේ. පසුගිය කාලයේ ළමුනගේ හැකියාවන් වර්ධනය කරන්නට ළමා ගී රැගත් **"හිරුමල හිනැහෙනවා"** සංයුක්ත තැටිය එළි දක්වන්නට අප වෙහෙසුනා.

මෙරට උපන් දරුවකුගේ හඬින් සිංහල ගීයක් අසන්නට ලැබෙන එක විශාල සතුටක් වගේම එවන් දෙයකට යොමු කරවා ගායනයෙන් පරිපූර්ණ කරනවා කියන්නේ බොහොම අමාරු කාර්‍යයක්. සිංහල සංගීතයේ අසම සම ගාන්ධර්වයාණන් වූ **ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්නයන්** හා එතුමා ගේ පුතුණුවන් වූ **අග්‍රා ප්‍රේමරත්නයන්** අවුරුදු එකහමාරක පමණ කාලයක් මුළුල්ලේ මහත් වෙහෙසක් දරා බස හා ගායනය නිවැරදිව හඬ නගන්නට දරු දැරියන්ව පුහුණුවීම් කටයුතු කොට කලා වූ මහඟු දායකත්වයත්, අධීක්ෂණ කටයුතු වල නිරත වෙමින් වෙහෙස මහන්සි වූ **සාමප්‍රිය සුමනසේකරයන්** ගේ නොනිමි කැපවීමත්, **මුතුහර** ළමා සමාජ්යේ දූ දරුවනගේ දෙමාපියනගේ සහයෝගයත් නොතිබෙන්නට මේ ළමා ගී සංයුක්ත තැටියක් එළිදක්වන කටයුත්ත තිඹිරි ගෙයි මියගිය සිහිනයක් වන්නට තිබුනා.

ඉංග්‍රීසි භාෂාවට හුරුවූ දෙතොලින් මුමුණනා වූ සිංහල ළමා ගීයක හුරතල් වූ හඬ ගෙන එමින්, මෙරටෙහි ම පද රචනයෙන්,සංගීතයෙන්,ගායනයෙන්වූ සියල්ල හා සිංහල ශබ්දාගාරයක සුසංයෝජන කටයුතුත්, සංයුක්ත තැටියේ ප්‍රතිගුණනයත්,අලංකාර නිමාවත් හා නිමවෙමින්, මෙරට දී අසන්නට **"හිරුමල හිනැහෙනවා"** සංයුක්ත තැටිය ඔබ අතට පත්වීම සතුටට කරුණක්.

මේ සටහන ගෙනෙන මා හට මතකය එක්තරා දිනකට දිවයයි. දූ දරුවන්ගෙන් පිරුණු අග්‍රා ප්‍රේමරත්නයන් ගේ **"ස්ටුඩියෝ අග්‍රා"** හි පුහුණුවීම් කෙරීගෙන යන මොහොතක්. මුතුහර ළමා සමාජ්යේ පුහුණු කිරීම් වන සැටි බලා හිඳීමෙන් මෙයට කොතරම් වූ මහන්සියක් ගත යුතුද යන්න දැනෙන්නේ මෙවිටය. මුලින්ම ගායනයට පෙර භාෂාව උච්චාරණය කරවීම සඳහා **ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්නයන්** හා **අග්‍රා** ගන්නේ මහත් උත්සාහයකි. දවසක දී මෙවැනි වූ වෙහෙසක් දරන්නට වේ නම් අවුරුදු එකහමාරක පමණ කාලයක් මුළුල්ලේ භාෂා උච්චාරණයට හා ගායනය ප්‍රගුණ කිරීමට කොපමණ වෙහෙසක් ගන්නට ඇතිදැයි සිතාගත හැක.

සිංහල පාසැලෙන් උගෙන ගන්නා දේ වගේම මෙවැනි අභ්‍යාසයක් තුලින් භාෂාව, සංස්කෘතිය පිළිබඳව දූ දරුවනට බොහෝ ප්‍රතිඵල ගෙන දුන් බව නිසැකය.

**"හිරුමල හිනැහෙනවා"** සංයුක්ත තැටිය බිහිකිරීමේදී දරු දැරියන් ගේ උනන්දුව, කැපවීම වාගේම ඔවුන් පෙරදැරිකරන් සහභාගීවීම් හා කලට වෙලාවට පුහුණු කිරීම් වලට සැළසුම් සකස් කරමින්, සම්බන්ධීකරණයෙන් සියළුම අවසථාවන් හිඳී මහඟු කාර්යභාරයක් ඉටුකල **රුශේන් සුමනසේකර** පුතුණුවනටද **මුතුහර** ආශිර්වාදයන් හිමිවේ.



කල්දෙමුල්ල
kaldemulla@gmail.com